
ජීවත්වන්නේ මැරෙන්නද?
නැත, සදහටම ජීවත්වන්නටයි.

# ජීවත්වන්නේ මැරෙන්නද?
# ... නැත, සදහටම ජීවත්වන්නටයි.

විද්‍යාව බොහෝ අංශයන්ගෙන් ප්‍රගතියක් ලබා ඇත, අභ්‍යවකාශය ගවේෂණ කිරීමට වුව, එහෙත් මරණය නමැති විෂය බොහෝසේ විපරමට ලක්වී නැත. මෙම විෂය සහ එහි ගුප්තභාවයද, මරණින්පසු ජීවිතයද අධ්‍යයනය කළ වෛද්‍යවෘර්තිකයන්, විද්‍යාවිශේෂඥයන් සහ චින්තකයන්ගේ ගණන අල්පය. විද්‍යාඥයින් මිනිස් සිරුර ගැනත් මෙම පෘථිවියේ එහි කෙටි පැවැත්මත් ගැන, පරමාණු ගැන,



ස්වභාවික ව්‍යසනයන් ගැන බොහෝ කරුණු කාරණා ලොවට කියාදෙන නමුත් සෑම මිනිසකුටම පැමිණෙන මෙම භයානක කෙළවර වන මරණය ගැන උගන්වා ඇත්තේ ඉතා ලුහුඬුන් බව පෙනේ. මරණය පිලිබඳ හැදෑරීමට හැකියාව හෝ කැමැත්ත ඇති අය ස්වල්ප දෙනෙකි, එහෙත් එය සියලුදෙනමවද, විද්‍යාඥයින්ව සහා පඬිවරයන්වද බේරිය නොහැකිසේ ගිලදමනවා ඇත. වේදනාව, දුක, රෝගීබව, තුවාලවීම්, භය, ශෝකය, සිත් බින්දියාම, බලාපොරොත්තු කඩවීම, හිඟකම අප අත්දකින්නේ අවසානයේ ඒවා තුලින් මරණය අප ගිලගෙන නැවත ජීවතුන්ගේ ලෝකයට නොපැමිනෙන බවද පෙන්නුම් කරමිනි.



මිනිසා සර්භාශය තුලින් පිටතට අවුත් සූයාීලොකය දකින්නේ හරියට මරණය සමගම ගිවිසුමක් ඇතිකරගත්තාක් මෙන්ය. තමන්ගේ කැමැත්තක් අකමැත්තක් එයට අදාල නැත. '' සියල්ලෝ ම පව් කොට දෙවියන් වහන්සේගේ ගැළවීමේ මාර්ගයෙන් ඉවත් වී සිටිති.''(රෝම 3:23) ''පාපයේ කුලිය මරණය ය.''(රෝම 6:23) ''තවද එක වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මිනිසාට නියම'' (හෙබ්‍රෙව් 9:27) බවද බයිබලය පවසයි.

අප සෑම කෙනෙක්ම නියත වශයෙන් මැරෙන්නේය. මේ ජීවිතයේදී අප දෙවියන් වහන්සේගෙන් වෙන්වී සිටින්නේනම්, මුළු සදාකාලය පුරාම එලෙස වෙන්වී සිටී .ඒ අනුව අපට සදහටම ජීවනයේ දීමනා වන ප්‍රේමය, සතුට, අලංකාරය, සත්‍යය, සාමය සහ ප්‍රීතිය අහිමිවී ගොස් ඉමහත් වේදනාව, අන්ධකාරය, තනිකම, ලැජ්ජාව සහ පසුතැවීම වැනි මරණයේ අසීමිත හිංසාවනට ගොදුරු වේ. මරණයේ අභිරහස විවරකොට මනුසතට ජීවනය සහ අමරණීය භාවයට ''ජීවමාන නව මාවතක්'' එළිදරව් කලේ එක්කෙනෙක් පමණි. ඒ අප ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. ඒ ගැන 2 තිමෝති 2:10 මෙසේ පවසයි:'' ... එහෙත් මෙය දැන් එළිදරව් කරන ලද්දේ අපේ මිදුම්කාරයාණන් වන ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ප්‍රකාශ වීමෙන් ය. උන් වහන්සේ මරණයේ බලය බිඳදමා, ජීවනයත්, අමරණීය භාවයත්, සුබ අස්න මඟින් හෙළි කර වදාළ සේක.''



ඉතිහාසය උන්වහන්සේ වටා, සහා මේ ලොවට ක්‍රිස්තුස්වහන්සේගේ උපත වටා බ්‍රමණය වේ. ඉතිහාසය ක්‍රිස්තු පූර්ව සහ ක්‍රිස්තු වර්ෂ, උපත සහ මරණය ලෙස දෙකොටසකට  බෙදයි. උන්වහන්සේ අපේ පාප උදෙසා දිවි පුදා, සොහොන්ගතකර දෙවියන් වහන්සේගේ බලයෙන් පාපය, මරණය, පාතාලය හා මිනීවල පරාජය කර නැවත උත්තානය වූ නිසා ජීවනය සහ මරණය උන්වහන්සේ වටා පරිභ්‍රමණය වෙ. අති විශාල ගෝලසමූහයක් එතුමන්ගේ උත්ථානය සියැසින් දැක සාක්ෂි දරන අතර වර්තමාන ලොව පුරා ලක්ෂසංකායයාත ජනයා, උන්වහන්සේ අදත් ඇත්තෙන්ම ජීවමාන බවට සාක්ෂි දරයි. ''ජීවමාන තැනැත්තා ය. මම මැරුණෙමි; එහෙත් බලන්න, මම සදහට ම ජීවත් ව සිටිමි. මරණයේ ද පාතාල ලෝකයේ ද යතුරු මට ඇත.''(එළිදරව් 1:18)

කුරුසියේ  මරණය දක්වා යේසුතුමන් යටහත් වුසේක.



සැමකෙනෙක් වෙනුවෙන්ම එතුමන්ට මරණය විඳින්නට විය. ''එසේ කෙළේ මරණය කෙරෙහි බලය ඇත්තා වන යක්ෂයා මරණය මඟින් විනාශ කොට, දිවි ඇති තාක් මරණ භයින් වහල්කමට යටත් ව සිටින සියල්ලන් නිදහස් කරන පිණිස ය.''(හෙබ්‍රෙව් 2:9,14,15).

මෙලොව තමන් ගතකල ජීවිතකාලයෙදී ජීවනය, මරණය සහ අමරනීයභාවය පිළිබඳ ක්‍රිස්තුස් වහන්සේ ගැඹුරින් ඉගැන්වූ සේක. තමන්වහන්සේම උත්ථානයද, ජීවනයද වන බවට එළිදරව් කළේ සුවකළනොහැකි රෝගීන් සුවකොට, මළවුන් නැවත නැගිටුවා, අන්ධයින්ට පෙනීම දී, බිහිරන්ට ඇසීම දී

සහ කොරුන්ට ඇවිදින සැලැස්වීමෙනි. දෙවියන් වහන්සේ කෙරෙහි අචල විශ්වාශයක් ඇතුව ජීවත්වීම උගන්වමින් උන්වහසේ වෙතට පිහිට සඳහා පැමිණි සැමගේ භෞතික අවශ්‍යතා ආශ්වර්යමත් ලෙස සපුරාලීය. මරණයෙන් පසු ජීවිතය ගැන එතුමාණෝ දැඩි ස්ථිරබවකින් ඉගැන්වූසේක. ස්වකැමැත්තෙන්ම උන්වහසේ අපගේ පාප තමන් මත දරාගෙන



කුරුසියමත අපගේ දඬුවම විඳදරා ගත්සේක. ඉන්පසු උන්වහන්සෙය් විජයග්‍රාහීලෙස උත්ථාන වූයේ අප උන්වහන්සේ අදහාගෙන මාර්ගයද, සත්‍යයද, ජීවනයද එතුමන්ම බව අප දැනගන්නා පිණිසය.

**මාර්ගය –** සදාතනික ජීවිතය පිලිබඳ පූර්ණ සහතිකයක් ඇතිව ඔබට මුහුණදෙන්නට වන සැම පීඩාවකින් ජයගෙන ඔබත් බයක් නැතුව මරණයට මුහුණ දෙන්නට සූදානම්ව දෙවි පියාණන් වෙතට ඔබ ගෙන එන ජීවමාන මාර්ගය යේසුස් වහන්සේය.

**සත්‍යය –** යේසුතුමණ්නම්, ඔබගේ හදවත ආශාවෙන් බලාසිටින සත්‍යය වෙ, ඔබව පාපෙන් සහ බයාදුකමින් නිදහස් කරන්නාවූ තැණන්වහන්සේය..

**ජීවනය –** ස්වභාවික මරණයට ගොදුරුනොවන, නොදිරන අමරණීය ශරීරයක් පැළඳගත් යේසුස් වහන්සේ වනාහි සදාතනික ජීවනය වන සේක.

තව කෙටි කලකින්, දුෂ්ට මරණයේ දූතයා ඔබේ ආත්මය හදිසි අනතුරකින්, රෝගයකින් නැතහොත් වයස්ගතවීම තුලින් ඉල්ලා සිටී. සදාකාලික මරණයෙන් ඔබගේ ආත්මය සදහටම නැතිවීමට පෙර, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා, ඔබට ඇති

බලවත් අවශ්‍යතාවය සලකා බලන්න. ''ජේසුස් වහන්සේ කතා කරමින්, පුනරුප්පත්තිය ද, ජීවනය ද මම වෙමි; මා අදහාගන්නා මැරුණත් ජීවත් වන්නේ ය;'' (යොහාන් 11:25) යයි පැවසීය. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහාගෙන, ඔබේ පව් ගැන පසුතැවිලිවී, උන්වහන්සේ තම ගැලවුම්කරු ලෙස පිළිගන්න. එවිට දෙවියන් වහන්සේ ඔබ ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන කළ ශුද්ධාත්මයාණවහන්සේගෙන් ඔබ පුරවන නිසා මරණයට තවදුරටත් ඔබ කෙරෙහි බලය පැවැත්වීමට නොහැකි වන්නේය.

පැමිණ, සවන්දී ඉගෙනගන්න. සත්‍යය ඔබව පවින් සහ මරණයෙන් නිදහස් කරයි. මේ ඇරයුම ඔබට කරන්නේ උත්ථානයද, ජීවනයද වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන් ය.

**යාච්ඤාව:**




ආදරණීය ස්වාමිවූ යේසුනි, මට ඇත්තේ එක ජීවිතයක් බවත් එය ඉක්මනින් අවසන් වන බවත් මට අවබෝධ වේ. මම පව්කරුවකු බවද තේරුම් ගත්තෙමි. මා සතු සම්පත්වලට හෝ මිතුරන්ට මා ගලවාගත නොහැක. කැඩුනු බිඳුණු හදවතක් සහිතව මම ඔබ වෙතට එමි. මගේ සෑම පාපයක් ගැනම මම පසුතැවිලි වෙමි. කරුණාකර මගේ පාප කමා කොට මා සේදුව මැනව. ඔබව මුණගැසෙන්නට මා සුදානම් කළ මැනව. ආමෙන්.''

